**බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**

--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව දෙසැම්බර් 01 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුස්තකාල පොත් ගිණුමේ ආරම්භක ශේෂය නිවැරදි කිරීම සඳහා රු.191,964 ක් පුස්තකාල පොත් ගිණුම හර කර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම බැර කිරීම වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුමට එම වටිනාකම බැර කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ මාගේ වාර්තාවේ 2.2.1 ඡේදයෙන් දක්වා තිබූ වරද නිවැරදි කිරීමට සේවක ඇප තැන්පත් ගිණුමට රු.8,810 ක් හා සේවක ඇප ආයෝජන ගිණුමට රු.56,409 ක් හර කර සමුච්චිත අරමුදලට රු.65,219 ක් බැර කිරීම වෙනුවට රු.73,119 ක් සේවක ඇප ආයෝජන ගිණුමට හර කර සේවක ඇප තැන්පත් ගිණුම බැර කර තිබුණි.

(ඇ) පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ණය පදනම මත සමාලෝචිත වර්ෂයේදී සභාවට ලබා දී තිබූ කැබ් රථය වෙනුවෙන් වැටුප් ප්‍රතිපූර්ණවලින් අඩුකර තිබූ රු.706,145 ක් වූ ණය වාරික මුදල් ගිණුම් ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබූ රු.3,178,457 ක් වූ කැබ් රථයේ වටිනාකම ගිණුම්ගත කිරීම සඳහා 2014.08.20 දිනැති අංක LGD/01/E/2012/10 දරන ලිපිය මගින් බස්නාහිර පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා ලබා දී තිබූ උපදෙස් ප්‍රකාරව කටයුතු කිරීම වෙනුවට සම්පූර්ණ වටිනාකම වත්කම් ගිණුම හර කර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම බැර කර තිබුණි.

(ඉ) කර්මාන්ත ණයහිමි ශේෂය රු.25,687 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ප්‍රධාන ලෙජරයට අනුව රු.33,748,486 ක් වූ වෙනත් ආදායම් ශේෂය රු.33,751,787 ක් ලෙස ආදායම් හා වියදම් ගිණුමට සටහන් කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ හිඟ හිරි කර්මාන්ත ආදායම් රු.26,733,120 ක් හිඟ හිරි ආදායම් ගිණුම හර කර ප්‍රාග්ධන ආධාර ගිණුම බැර කර තිබියදී නැවත සමාලෝචිත වර්ෂයට අදාල හිඟය ලෙස රු.50,234,779 ක් හිඟ හිරි වෙනත් ආදායම් ගිණුම හර කර ප්‍රාග්ධන ආධාර ගිණුම බැර කර තිබීම නිසා හිඟ හිරි කර්මාන්ත ආධාර ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන ආධාර ආදායම රු.50,234,779 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පත් ගිණුම් ශේෂය රු.128,984 ක් ලෙස 2011 වර්ෂයේ සිට දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ මුලා ප්‍රකාශන වල එය ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 49,747,634 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,295,262 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,755,603 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000’ | රු.000’ | රු.000’ |
| (i.) | වරිපනම් හා බදු | 9,020 | 7,072 | 8,758 |
| (ii.) | බලපත්‍ර ගාස්තු | 181 | 160 | 181 |
| (iii.) | වෙනත් ආදායම් | 90,272 | 14,859 | 117,005 |

2:2.2 බලපත්‍ර ගාස්තු

2013 වර්ෂයට අදාලව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික ස්ථාන විසින් වාර්ෂික බලපත්‍ර ලබාගැනීම පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) බලපත්‍ර වර්ග 18 කට අදාල බලපත්‍රලාභීන් 157 දෙනෙකුගෙන් 104 දෙනෙකු 2013 වර්ෂයෙ බලපත්‍ර අප්‍රේල් මාසයෙන් පසුව ලබාගන තිබුණි.

(ආ) බල ප්‍රදේශය තුළ එළවළු විකිණීමේ ව්‍යාපාර, මල්ශාලා, රසායනික පොහොර/ කෘෂි රසායන අලෙවිසැල් හා ධීවර වෙළඳසැල් පවත්වා ගෙන ගියද බලපත්‍ර ලේඛනය අනුව එවැනි වෙළඳසැල් කිසිවකින් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.

(ඇ) බලපත්‍ර ලබාගැනීම පමාදවීම හා බලපත්‍ර ලබා නොගැනීම සම්බන්ධයෙන් විගණිත දිනය වූ 2014 ජුනි 30 දින වන විටත් සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 6,326,485 |
| (ii) | මුද්දර ගාස්තු | 66,276,297 |

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) <u>බණ්ඩාරගම මල්වත්ත පාර 2 වන පටුමඟ (1අදියර)</u>

ඉහත මාර්ගය දිගින් මීටර් 126 ක්ද, පළලින් මීටර් 3.66 ක්ද තැනීම වෙනුවෙන් රු.1,000,000 ක ඇස්තමේන්තුවක් 2013 අගෝස්තු 14 දින අනුමත වී තිබුණි. 2014 ජූනි 27 දින සභාවේ තාක්ෂණික නිලධාරී සමඟ කළ භෞතික පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) වරාය හා මහා මාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (මඟ නැඟුම) ගේ 2013 අගෝස්තු 01 දිනැති අංක MPH/HYW/MNG/D දරන ලිපියට අනව රු.1,000,000 ක ව්‍යාපෘතියක් සඳහා කොන්ක්‍රීට් කුට්ටි ගල් 19000 ක් ඇතිරිය යුතු වුවත් පිළියෙල කර තිබූ ඇස්තමේන්තුව හා ගෙවීම් වාර්තාවට අනුව ගල් 17200 ක් දැක්විණි.

(ii) මාර්ගය වැඩ නිමවූ පසු දෙපස පස් පුරවා සැකසීම සඳහා රු.9,008 ක් ගෙවීම් කර තිබුණද මාර්ගය දෙපස පස් පුරවා නොතිබුණි.

(ආ) <u>කඹුරුගොඩ විලේගොඩ පින් ළිඳ දක්වා මාර්ගය</u>

මෙම මාර්ගය දිගින් මීටර් 126 ක් හා පළලින් මීටර් 3.66 ක් ඉදිකිරීම සඳහා රු.1,000,000 ක ඇස්තමේන්තුවක් 2013 අගෝස්තු 16 දින අනුමත වී තිබුණි. තාක්ෂණික නිලධාරී සමඟ 2014 ජූනි 27 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) අමාත්‍යාංශ උපදෙස් වලට පටහැනිව කොන්ක්‍රීට් කුට්ටි ගල් 17200 ක් ඇතිරීම සඳහා ඇස්තමේන්තුව පිළියෙල කර තිබුණි.

(ii) භෞතිත පරීක්ෂාවේදී දිග මීටර් 194.3 ක්ද, කොන්ක්‍රීට් බාධකයක් සමඟ සාමාන්‍ය පළල මීටර් 3.5 ක් වූ අතර කොන්ක්‍රීට් බාධකයේ පළල මීටර් 0.3 ක් විය. නිම කරන ලද මාර්ගයේ ස්ථාන තුනකදී ගත් මැනුම් අනුව වර්ග මීටරයකට ගල් 41 ක් (සාමාන්‍ය අගයක් ලෙස) අතුරා තිබූ අතර ඒ අනුව මාර්ග තලය සඳහා ගල් 25490 ක් අතුරා ඇති බව තහවුරු විය. ඒ අනුව ඇස්තමේන්තුවට වඩා වැඩියෙන් ගල් 14651 ක් අතුරා තිබූ මීටර් 74.3 සඳහා අමතර ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබූ අතර අතිරේක ප්‍රතිපාදන ලබාගත් ආකාරය පිළිබඳ තොරතුරු කිසිවක් ද විගණනයට ඉදිරිපත් නොවුණි.

(iii) පින් ළිඳ පැත්තෙ සිට මීටර් 50 ක් පමණ දුරින් මාර්ගයේ වම් පස පැති බැම්ම පුපුරා කැඩී ගොස් තිබුණි.

(iii) මාර්ගය දෙපස පස් පිරවීම සඳහා රු.9,008 ක් ගෙවීම් කර තිබුණද පස් පුරවා නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-----------------------------

(අ) <u>ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්</u>
සභාවේ ජංගම ගිණුම් 2 කට අදාලව 2014 අප්‍රේල් 30 දිනට මාස 06 ඉක්ම වූ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.50,234 ක් වූ චෙකපත් 17 ක් සම්බන්ධව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඇ) විධිවිධාන අනුව ක්‍රියාකර නොතිබුණි.

(ආ) <u>අත්තිකාරම් පියවීම</u>
මුදල් රෙගුලාසි 371(අ) ප්‍රකාරව ලබා ගත් අත්තිකාරම් අදාල කාර්ය නිම කළ වහාම පියවිය යුතු වුවත් 2013 වර්ෂයේ අවස්ථා 8 කදී ලබා දී තිබූ රු.317,000 ක් වූ අත්තිකාරම් මුදල් මාස 02 ත් මාස 09 ත් අතර කාල පරාසයක් ප්‍රමාද කර පියවා තිබුණි. එසේම 2013 දෙසැම්බර් 31 දිනට රු.4,161,182 ක නොපියවූ අත්තිකාරම් ශේෂයක් පැවති අතර ඉන් රු.881,105 ක 2000 වර්ෂයට පෙර සිට පැවත එන හඳුනානොගත් ශේෂයක් විය.

(ඇ) <u>සේවක ඇප</u>
සභාවේ ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයින් 37 කින් 27 දෙනෙකුම ඇප තබා නොතිබුණි.

(ඈ) <u>කිරිහල අලෙවි ආදායම් එකතු කිරීම</u>
ප්‍රාදේශීය සහා ප්‍රධාන කාර්යාලය ආසන්නයේ පවත්වාගෙන ගිය සභාව සතු කිරිහලේ එකතු වන මුදල් දිනපතා සභාවට ප්‍රේෂණය කිරීම සිදු කර නොතිබුණු අතර ලද දෛනික ආදායම සභාවට ප්‍රේෂණය කිරීම දින 03 සිට දින 06 දක්වා කාලපරාසයක් ප්‍රමාද වී තිබුණි.

(ඉ) <u>වාහන අනතුරු</u>
සභාවේ කැබ් රථයක් 2013 වර්ෂයේදී අනතුරකට භාජනය වී තිබූ අතර එම වාහනය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.108,480 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 103(1) හා 104(1) විධිවිධාන අනුගමනය කර නොතිබුණි.

3.3 <u>අවිධිමත් ගනුදෙනු</u>

(අ) සභාවේ ලේකම්වරයා 2013 ඔක්තෝබර් 04 දින නිවාඩු ලබා තිබූ අතර වැඩ අධිකාරීවරයා 2013 ඔක්තෝබර් 04, 23 හා නොවැම්බර් 23 දින නිවාඩු ලබාගෙන තිබූ නමුත් එම දිනයන්හි පවත්වා තිබූ සැළසුම් කමිටු සඳහා එම නිලධාරීන් දිනකට රු.650 බැගින් දීමනා ලබා ගෙන තිබූ බව විගණන නියැදි පරීක්ෂාවේදි අනාවරණය විය.

(ආ) සභාව සතුව යතුරු පැදි 5 ක් ඉන්ධන සපයාගැනීමේ පදනම මත සභාවේ සේවකයින් 5 දෙනෙකුට ලබා දී තිබුණි. යතුරුපැදි පැවරීම් ලිපියට අනුව වාර සේවා හා නඩත්තු කටයුතු, පැවරුම්ලාභී නිලධාරියා විසින් ඉටු කර ගත යුතු බව සඳහන් වුවත් නඩත්තු හා වාර සේවා කටයුතු සඳහා 2013 වර්ෂයේදී රු.143,926 ක් සභාව විසින් දරා තිබුණි.

3.4 <u>මානව සම්පත් කළමනාකරණය</u>
2013 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ සේවකයන් 18 දෙනෙකුගේ ඌනතාවයක් හා සේවකයන් 4 දෙනෙකුගේ අතිරික්තයක් පැවති බව අනාවරණය විය.

4. පද්ධති හා පාලන
-------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය
(ii) ආදායම් පරිපාලනය
(iii) මූල්‍ය පාලනය
(iv) වත්කම් කළමනාකරණය
(v) තොග පාලනය